මගේ අංකය :- ජේඑස්සී/එස්ජී/සීඅයිආර්/2008

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 317**

සියළුම විනිශ්චයකාරවරුන් වෙතටයි

## <u>ත්‍රෛමාසික වැඩ වාර්තා (සිවිල් හා අපරාධ අධිකරණ)</u>

2008 සැප්තැම්බර් මස 30 වන දිනෙන් අවසන් වන තෙවැනි කාර්තුවේ සිට ත්‍රෛමාසික වැඩ වාර්තා ඇමුණුමේ ඇති ආකෘතිය අනුව යොමු කිරීමට කටයුතු කල යුතු බවට සියළුම අධිකරණ නිළධාරීන්ට දැනුම් දීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත. මේ අනුව 2008 සැප්තැම්බර් 30 වන දිනෙන් අවසන් වූ කාර්තුවේ සංඛ්‍යාලේඛන ද මෙම ආකෘතිය මගින් එවිය යුතුය.

02. පසුගිය ත්‍රෛමාසිකය අවසානයේදී අවසන් නොවූ වසර දෙකකට වැඩිකාලයක් පවතින නඩු කාල සීමාව අනුව A, B සහ C පේළි වල දැක්විය යුතු අතර ත්‍රෛමාසිකය අවසානයේදී අවසන් නොවී පවතින අවුරුදු දෙකකට වැඩි නඩු කාල සීමාවන් අනුව W, X සහ Y පේළි වල දැක්විය යුතුය. දැනට පවතින සියළුම නඩු වල භෞතික ගණනය කිරීමක් කර මෙම විස්තර ඉදිරිපත් කිරීම නිර්දේශ කරනු ලැබේ.

03. වැඩ වාර්තාවේ සෑම පේළියකින්ම අපේක්ෂා කරන විස්තර පිළිබඳ පැහැදිලි කිරීමක් ද ආකෘතිය සමග සපයා ඇත.

04. එවනු ලබන සෑම විස්තරයකම නිරවද්‍යතාවය පිළිබඳව අදාල විනිශ්චයකාරවරයා පෞද්ගලිකව වගකිවයුතු වන අතර වැටුප් වර්ධක, උසස් වීම් ආදිය ලබා දීම සඳහා ඇගයීම් කිරීමේදී මෙම තොරතුරු භාවිතා කරනු ලැබේ.

05. ඒ අනුව 2008 තෙවැනි කාර්තුව අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි ත්‍රෛමාසික වාර්තාව මෙම ආකෘතිය මගින් පමණක් ඉදිරිපත් කල යුතු අතර, එසේ ඉදිරිපත් කරනු ලබන ත්‍රෛමාසික වාර්ථාව සහ දැනට එවනු ලබන අනෙකුත් වැඩ වාර්තා (උදා. දින සටහන්, මාසික සාරාංශ වාර්තා ආදිය) දැනට එවනු ලබන පරිදි තවදුරටත් ඉදිරිපත් කල යුතුය.

පී. ඩබ්ලිව්. ඩී. සී. ජයතිලක
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

පී. ඩබ්. ඩී. සී. ජයතිලක
ලේකම්.
අධිකරණ සේවා කොමිෂන් සභාව.
කොළඹ 12.

2008 ඔක්තෝම්බර් මස 20 දින

කොළඹ 12

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.